ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1972/50 - 2016 ජුනි මස 24 වැනි සිකුරාදා - 2016.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

2010 අංක 04 දරන ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය

ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක 04 දරන ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 23 වැනි හා 28 වැනි වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාවේ මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු අමාත්‍ය සෙන්දිල් තොණ්ඩමාන් වන මා විසින් 2010 අංක 04 දරන ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යටතේ සම්පාදිත අංක 1826/24 හා 2013 සැප්තැම්බර් මස 04 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රෙගුලාසි මාලාවේ 34 වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීම අනුමත කරන ලද බව මෙයින් දැනුම් දෙමි. මෙම විධිවිධාන 2016 ජුනි මස පළමුවැනි දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

සෙන්දිල් තොණ්ඩමාන්,
මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන,
වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු අමාත්‍ය.

2016 ජුනි මස 01 වැනි දින,
ඌව පළාතේ මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන,
වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු අමාත්‍යාංශ කාර්යාලයේ දී ය.

**IV පරිච්ඡේදය**

*34. විශ්‍රාම ගැන්වීම*

(1) සමුපකාර සේවකයෙකුගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 ක් විය යුතු ය. කිසියම් සමුපකාර සේවකයෙකු අවුරුදු 57 ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම්, සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමකින් තොරව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස වන අවුරුදු 60 දක්වා සේවයේ රැඳී සිටීමට සේවකයාට ඉඩදෙනු ලැබේ.

(2) වයස අවුරුදු 55 සම්පූර්ණ වූ සේවකයෙකුට විශ්‍රාම ගැනීමට අවශ්‍ය වන්නේ නම්, කාරක සභාව වෙත ලිඛිත දැනුම් දීමක් කර සේවයෙන් විශ්‍රාම ගැනීමට සේවකයාට හිමිකම් ඇත.

(3) ඉහත සඳහන් පරිදි අවුරුදු 55 සම්පූර්ණ වූ සේවකයෙකු විශ්‍රාම ගන්නා විටදී, තමන් විශ්‍රාම ගනු ලබන දිනය අවම වශයෙන් මාස 03 කට වත් කලින් සමිතියේ කාරක සභාවට ලිඛිතව දැනුම්දිය යුතු ය.

07 - 521

1A - PG 2991 — 10 (2016/06)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*